# නාමපද
## (Nouns)

ලිංග භේදය, වචන භේදය, නියති - නියත භේදය විභක්ති භේදය යන ව්‍යාකරණ ලක්‍ෂණවලින් යුතු පුද්ගලයකු, ස්ථානයක් හෝ ද්‍රව්‍යයක් හැඳින්වීම සඳහා භාවිත කෙරෙන වචන නාමපද නම් වේ. නාමප්‍රකෘතියට ප්‍රත්‍යයක් එක්වීමෙන් හෝ නාම කිහිපයක් එක්වීමෙන් නාමපද සෑදේ.

උදා :- බලු + ආ = බල්ලා, ගස් + අ = ගස, මිනිස් + උ = මිනිස්සු

ඇඳ + ඇතිරිලි = ඇඳඇතිරිලි ඇත් + අස් + රිය + පාබල = ඇත්අස්රියපාබල

### නාමපද වර්ගීකරණය

නාමපද කිහිපාකාරයකින් වර්ග කළ හැකි ය.

**(1). සංස්ථිතික වශයෙන් :-**

නාමපදයක් සකස් වී ඇති ආකාරය අනුව එය ත්‍රිවිධාකාර ය.

එනම් :-

**1. සරල නාම** :- නාමපදයක මුල් අවස්ථාව එනම් නාමප්‍රකෘතිය, නාමමූලය හෙවත් ලිංගය මෙනමින් හැඳින්වේ.

උදා :- වඳුරු බලු යක් කරුලු මිනිස් දෙවි ගැහැනු ගම් රට

**2. සංකීර්ණ නාම** :- නාමය හා ප්‍රත්‍යය එක්වීමෙන් සෑදෙන නාම මීට අයත් ය.

උදා :- වඳුරා බල්ලා යකා කුරුල්ලා මිනිසා දෙවියා ගැහැනිය ගැමියා රැටියා

**3. සමාස නාම** :- ප්‍රකෘති දෙකක් හෝ කිහිපයක් එක් වීමෙන් සෑදෙන නාම සමාස නාම වේ.

උදා :- ගුණ + දහම් = ගුණදහම් සව් + සිරි = සව්සිරි ස + දෙව් + ලොව = සදෙව්ලොව

**(2). අන්ත වශයෙන් :-**

නාමප්‍රකෘතිය අවසන් වන අක්‍ෂරයේ ස්වභාව අනුව නාම දෙවැදෑරුම් වේ.

එනම් :-

**1. ස්වරාන්ත** :- පිරිමි, ගැහැනු, කුරුලු

**2. හලාන්ත** :- මිනිස් ගොන් ගස්

### (3). ප්‍රයෝගාර්ථ වශයෙන් ඃ-

**1. නාම නාම ඃ-** මිනිස්, දෙව්, බඹ, ගස්, වැල්

**2. සර්ව නාම ඃ-** එ (ඔහු - ඔවුහු), ත (තෝ - තොපි), ම (මම - අපි)

**3. සංඛ්‍යා නාම ඃ-** එක, දෙක, දහය

**4. ප්‍රත්‍යාර්ථ නාම ඃ-**

I. කෘදන්ත - නටන, දුවන, බලන
II. තද්ධිත - ගුණවත්, තොටි, මනුෂ්‍යත්ව

**5. සමාස නාම ඃ-** දිගැසි, නිලුපුල්, සුරනර, සහසැස්, මව්පිය

### 1. නාම නාම ඃ-

නාමනාම ප්‍රභේද පහකි.

එනම් ඃ-

I. ජාති - බඹ, දෙව්, මිනිස්, කොටි
II. ද්‍රව්‍ය - පොත්, මැටි, පුටු, මේස
III. ගුණ - රත, නිල, සුද
IV. ක්‍රියා - දුවන්නා කරන්නා, නටන්නා
V. සංඥා - දෙව්දත්, බඹදත්, සුදත්, ජගත්, සරත්

## ලිංග භේදය

| **පුරුෂ ලිංග** | **ස්ත්‍රී ලිංග** | **නපුංසක ලිංග** |
|---|---|---|
| දෙවියා | කත | ගස |
| මිනිසා | ගැහැනිය | මල |
| ගොනා | ළඳුරිය | දහම |
| රජතුමා | අඹුව | රුක |
| නාග | විදුලිය | ගල |
| පියා | සභාව | පැන |
| ඇතා | මව | පොත |

## ලිංගත්‍රයට ම පොදු ශබ්ද

| **පුරුෂ ලිංග** | **ස්ත්‍රී ලිංග** | **නපුංසක ලිංග** |
|---|---|---|
| මේ මිනිසා | මේ ගැහැනිය | මේ මල |
| අර මිනිසා | අර ගැහැනිය | අර මල |

## අර්ථ ක්‍රියා :-

| | |
|---|---|
| මේ එන්නේ මිනිසෙකි. | මේ එන්නී ගැහැනියකි. |
| අර නටන්නේ මිනිසෙකි. | අර නටන්නී ගැහැනියකි. |

## ස්ත්‍රී ලිංග භාවිතය

නාමයක් ස්ත්‍රී ලිංග වශයෙන් සාදගන්නා ප්‍රධාන ක්‍රම 4කි.

**1. ප්‍රත්‍ය යෙදීමෙන් :-**

| | | | | |
|---|---|---|---|---|
| උද :- | 'ඉ' | බළලා > බැළලී | මහල්ලා > මැහැල්ලි | කුකුළා > කිකිළි |
| | 'ඊ' | කුමරා > කුමරී | සතුරා > සැතිරි | |
| | 'ඉනි' | නයා > නැයිනි | ඇතා > ඇතිනි | කොකා > කෙකිනි |

**2. මුල් ශබ්දයට උපකාරක පදයක් එක්කිරීමෙන් :-**

උද:- කොටියා > කොටි දෙන  එළුවා > එළුදෙන  දිවියා > දිවිදෙන

**3. වෙනස් ම ශබ්දයක් යෙදීමෙන් :-**

උද :- මොනරා > සෙබඩ, අශ්වයා > වෙළඹ, මිනිහා > ගැහැනිය, ගොනා > එළදෙන

**4. ස්වර විපර්යාස වීමෙන් :-**

උද:- සොරා > සෙර  කොරා > කෙර  ගරුඬා > ගරුඬි

# නාම

ප්‍රාණවාචී | අප්‍රාණවාචී

පුරුෂ ලිංග | ස්ත්‍රී ලිංග

| ස්වරාන්ත | හලාන්ත | ස්වරාන්ත | හලාන්ත | ස්වරාන්ත | හලාන්ත |
|---|---|---|---|---|---|
| බලු | මිනිස් | ගැහැනු | මව් | ඇඳ | ගස් |
| කුරුලු | යක් | කුමරි | කත් | පුටු | පොත් |

## නිශ්චිත අනිශ්චිත භේදය

| ඒකවචන | | බහුවචන | | උක්ත අනුක්ත |
|---|---|---|---|---|
| නිශ්චිත | අනිශ්චිත | නිශ්චිත | අනිශ්චිත | |
| මිනිසා<br>(The man)<br><br>ගැහැනිය<br>(The woman) | මිනිසෙක්<br>(A man)<br><br>ගැහැනියක්<br>(A woman) | මිනිස්සු<br>(The men)<br><br>ගැහැනු<br>(The women) | මිනිස්සු<br>(Men)<br><br>ගැහැනු<br>(Women) | උක්ත<br><br>(Subject) |
| මිනිසා<br>(The man)<br><br>ගැහැනිය<br>(The woman) | මිනිසකු<br>(A man)<br><br>ගැහැනියක<br>(A woman) | මිනිසුන්<br>(The men)<br><br>ගැහැනුන්<br>(The woman) | මිනිසුන්<br>(Men)<br><br>ගැහැනුන්<br>(Women) | අනුක්ත<br><br>(Object) |

## ශබ්ද වරනැඟීම

පුරුෂ ලිංග ‘මිනිස්’ ශබ්දය

| විභක්ති | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පෙර | මිනිසා | මිනිස්සු |
| කම් | මිනිසා | මිනිසුන් |
| කතු | මිනිසා විසින් | මිනිසුන් විසින් |
| කරණ | මිනිසා කරණකොට | මිනිසුන් කරණකොට |
| සපදන් | මිනිසාට | මිනිසුන්ට |
| අවදි | මිනිසාගෙන් | මිනිසුන්ගෙන් |
| සබඳ | මිනිසාගේ | මිනිසුන්ගේ |
| අදර | මිනිසා කෙරෙහි | මිනිසුන් කෙරෙහි |
| අලප් | මිනිස | මිනිසුනි |

## ස්ත්‍රී ලිංග 'ගැහැනු' ශබ්දය

| විභක්ති | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පෙර | ගැහැනිය | ගැහැනු |
| කම් | ගැහැනිය | ගැහැනුන් |
| කතු | ගැහැනිය විසින් | ගැහැනුන් විසින් |
| කරණ | ගැහැනිය කරණකොට | ගැහැනුන් කරණකොට |
| සපදන් | ගැහැනියට | ගැහැනුන්ට |
| අවදි | ගැහැනියගෙන් | ගැහැනුන්ගෙන් |
| සබඳ | ගැහැනියගේ | ගැහැනුන්ගේ |
| අඳර | ගැහැනිය කෙරෙහි | ගැහැනුන් කෙරෙහි |
| අලප් | ගැහැනිය | ගැහැනුනි |

## නපුංසක ලිංග 'ගස්' ශබ්දය

| විභක්ති | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පෙර | ගස | ගස් |
| කම් | ගස | ගස් |
| කතු | ගසින් | ගසින් |
| කරණ | ගසින් / ගස කරණකොට | ගසින් / ගස් කරණකොට |
| සපදන් | ගසට | ගස්වලට |
| අවදි | ගසින් | ගස්වලින් |
| සබඳ | ගසේ | ගස්වල |
| අඳර | ගසෙහි / ගසැ | ගස්වල |
| අලප් | ගස | ගස් |

## 2. සර්වනාම :-

නාමයක් වෙනුවට යෙදෙන නාම සර්වනාම නම් වේ. 'අභින්න නාම' යනුවෙන් ද මෙය හැඳින්වේ.

**පුරුෂත්‍රයෙහි සර්වනාම :-**

ප්‍රථම පුරුෂ :- ඒ

මධ්‍යම පුරුෂ :- ත

උත්තම පුරුෂ :- ම

# සර්වනාම ප්‍රභේද 07 කි.

**1. පුරුෂ වාචක සර්වනාම :-**

| | |
|---|---|
| (අ) ප්‍රථම පුරුෂ :- | සිරිපාල කයි. හේ වතුර ද බොයි.<br>සිරියාවතී බත් උයයි. ඇය බත් බෙදයි.<br>ගස කැපේ. එය වැටේ. |
| (ආ) මධ්‍යම පුරුෂ :- | තෝ බුදුන් වඳිහි. තොපි තෙරුවන් නමදිහු.<br>කුමරිය, තී කුමක් කරහි ද? |
| (ඉ) උත්තම පුරුෂ :- | ළමයා කියයි, මම සිසුවෙක්මි.<br>ළඳුරිය කියයි, මම ළඳුරියක්මි. |

**2. සූචක සර්වනාම :-**

සමීප හෝ දුර වශයෙන් යමෙක් හෝ යමක් දැක්වීම සූචක නම් වේ.

| **සමීප සූචනය** | **දූර සූචනය** |
|---|---|
| මේ මිනිසෙකි. | අර ළමයෙකි. |
| මෝ ගැහැනියකි. | අර වනිතාවකි. |
| මූ සිව්පාවෙකි. | අර (තෙල) දිස්වන්නේ සීගිරියයි. |

**3. ප්‍රශ්නවාචක සර්වනාම :-**

ප්‍රශ්න කිරීම් වශයෙන් යෙදෙන සර්වනාම මීට අයත් වේ.

කෙ - මම් කෙසේ පවසම් මගේ දුක ?

කුම් - නුඹ කුමක් කරහි ද?

කවර - කවරෙක් මා රකින්නේ ද?

කො - කොතැන ද මේ කය ඇරගෙන යන්නේ ?

**4. අනියම සර්වනාම :-**

අනිමාර්ථය පැවැසෙන සර්වනාම මෙනමින් හැඳින්වේ. මෙබඳු නාම බහුවචනයෙන් සිටී.

ඇතැම් - ඇතැමෙක් බණ කියති.

ඇතැම්හු සොරකම් නොකරති.

අය - නටත් අයෙක් සුරා මතින්.

අයෙක් දහම්හි හැසිරෙති.

කිසි - කිසිවෙක් සැමදා නොවෙසෙති.

ඇතැමෙක් කිසිවක් නොදනිති.

**5. සම්බන්ධක සර්වනාම :-**

කිසියම් වාක්‍යයක් තවත් වාක්‍යයකට සම්බන්ධය දැක්වීම් වශයෙන් යෙදෙන සර්වනාම මීට අයත් වේ.

උදා :- යමෙක් බොරු නොකියයි ද ඔහු සුදනෙකි.

යමෙක් වපුරයි ද ඔහු අස්වැන්න ලබයි.

යමෙක් මැරේද ඔහු යළි උපදී.

**6. සමූහය සර්වනාම :-**

සමූහය හඟවන සැම, සව්, සියලු, සකල යන සර්වනාම මීට අයත් වේ.

උදා :- සැම - වෙත්වා සව්සත හැමකල් නිදුකි.

සව් - සව් සිරියෙන් සපිරි සිරගෙයකි.

සියලු - සියල් සතුන් මරු ගෙන යනවා ම ය.

සකල - සකල සත ම බොදු බැතියෙන් නැහැවෙති.

**7. අවධාරණ සර්වනාම :-**

යමක් අවධාරණයෙන් ප්‍රකාශ කිරීම සඳහා භාවිත කෙරෙන සර්වනාම මෙනමින් හැඳින්වේ.

උදා :- මිනිස් තෙම කුසල් වඩයි.

හෙතෙම වැස්සට තෙමෙයි.

රජ තෙමේ දහදියෙන් තෙමේ.

භික්ෂු තෙමේ අමාදියෙන් තෙමේ.